## 201/B

### ඉදුණු දෙළුම්හි රසායනික ගුණාත්මය අභිබවමින් පෙරට පැමිණි විශ්මිත නොමේරු දෙළුම්

පී.එස්.අයි.යූ. ජයරත්න[1], ඩී.සී. අබේසිංහ[1*], ආර්.ජ්.ම්. ධර්මදාස[2] සහ එස්.බී.ඒ. වීරවර්ණ[3]

[1]කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ අධ්‍යයනාංශය, කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ පීඨය,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල.
[2]කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ 07.
[3]කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, කල්පිටිය.

බොහෝ දෙනෙකු ප්‍රිය කරන දෙළුම්, ප්‍රකට පලතුරකි. මෙය රෝග නිවාරණයට ගන්නා වටිනා ඖෂධයකි. ශ්‍රී ලංකාවේ, වර්තමානයේ "කල්පිටිය-හයිබ්‍රිඩ්", "නිමාලි", "දයා" හා "නයන" යන දෙළුම් ප්‍රභේද හතර වගා කෙරෙන අතර මදුළු රත් පැහැති "කල්පිටිය-හයිබ්‍රිඩ්" ප්‍රභේදයේ ඵලාවරණය තැඹිලි-රෝස පැහැතිය. කහ පැහැති ඵලාවරණයක් සහිත නිමාලි සහ දයා ප්‍රභේද වල මදුළු රෝස පැහැවේ. නයන ප්‍රභේදයේ ඵලාවරණය ලා රෝස පැහැති වන අතර එහි මදුළු වල රෝස පැහැය දයා සහ නිමාලි ප්‍රභේදවලට සාපේක්ෂව තීව්‍රවේ.

ඉහළ ඖෂධීය වටිනාකමක් ඇති දෙළුම්, පුරාණ හෙල වෙදකම තුළ යම් යම් රෝගාබාධ, විශේෂයෙන්ම උදරාබාධ, අතීසාරය වැනි ආමාශයික රෝග සහ ඩෙංගු වැනි රුධිරගත රෝග නිවාරණයට යොදාගෙන තිබෙන අතර සුවිශේෂත්වය වන්නේ මෙහිදී නොමේරු දෙළුම් යුෂ (මසක් පමණ වයසැති) හා මී පැණි සංකලනයක් යොදා ගැනීමයි. ජනතාව ප්‍රධාන වශයෙන් භාවිතයට ගන්නා ඉදුණු දෙළුම් භාවිතයට නොගෙන, නොමේරු දෙළුම් හෙළ වෙදකම තුළදී යොදා ගැනීම කුතුහලයට කරුණකි. එබැවින් මෙහි විද්‍යාත්මක සත්‍යතාව සෙවීමට දෙළුම් වල රසායනික ගුණාත්මය (ප්‍රතිඔක්සිකාරක ගුණය) එහි වර්ධන අවධි අනුව කෙසේ වෙනස්වේද යන්න උක්ත සියලුම දෙළුම් ප්‍රභේද ආශ්‍රයෙන් නිර්ණය කරන ලදි. එහිදී මාස එකක (නොමේරු දෙළුම්), මාස දෙකක, මාස තුනක හා මාස හතරක (ඉදුණු දෙළුම්) ලෙස වර්ධන අවධි හතරක පවතින දෙළුම් වල රසායනික ගුණාත්මය පරීක්ෂණාත්මකව නිර්ණය කරන ලදී.

විශ්මයට කරුණ නම්, නොමේරු දෙළුම්ඵල වල ඉතා ඉහළ රසායනික ගුණාත්මයක් අනෙක් වර්ධන අවධි අභිබවා වාර්තා වීමත්, මෙකී රසායනික ගුණාත්මය එහි වර්ධනයත් සමග ක්‍රමයෙන් හීන වී යන බවත් නිරීක්ෂණය වීමයි. එබැවින් නොමේරු දෙළුම් හා සසඳන කල ඉදුණු දෙළුම්වල අඩු රසායනික ගුණාත්මයක් වාර්තා විණි. එනම් හෙළ වෙදකම තුළ රෝග නිවාරණයට නොමේරු දෙළුම් යොදා ගැනීම තවදුරටත් නොරහසකි. එසේම මෙහිදී විවිධ වර්ධන අවස්ථා වල පවතින දෙළුම් වල ඵලාවරණය හා මදුළුවල රසායනික ගුණාත්මයද නිර්ණය කරන ලද අතර එහිදී මදුළු සතුව ඉතා අඩු රසායනික ගුණාත්මයක් ඵලාවරණයට සාපේක්ෂව පවතින බවද අනාවරණය විය. එසේම, ඵලාවරණයේ/ මදුළු වල පැහැයේ තීව්‍රවීම ඒවායෙහි රසායනික ගුණාත්මය කෙරෙහි ඍජු සම්බන්ධතාවයක් නොමැති බවද මෙහිදී වාර්තා විය. මන්දයත්, ලා රෝස පැහැති මදුළු සහිත නිමාලි ප්‍රභේදය අනෙකුත් ප්‍රභේද තුන අභිබවා ඉහළම රසායනික ගුණාත්මයක් පෙන්වීමයි.

මේ අනුව දෙළුම් ඵලයේ නොමේරු අවස්ථාවේ ඉහළම රසායනික ගුණාත්මයක් පවතින බවත් වර්ධනයත් සමග එහි රසායනික ගුණාත්මය ක්‍රමයෙන් අඩුවී යන බවත් මදුළු හා සසඳන කළ ඵලාවරණයේ ඉහළ රසායනික ගුණාත්මයක් පවතින බවත් ඵලාවරණයේ/ මදුළු වල පැහැයේ තීව්‍රවීම ඒවායෙහි රසායනික ගුණාත්මය කෙරෙහි ඍජු සම්බන්ධතාවයක් නොමැති බවත් මෙම පර්යේෂණය මගින් තහවුරු වී ඇත. එබැවින් අනාගතයේ විවිධ රෝග නිවාරණයට නොමේරු දෙළුම් හා ඵලාවරණය ආශ්‍රයෙන් නව ඖෂධීය නිෂ්පාදන බිහි වීමට මෙම පර්යේෂණ ප්‍රතිඵල මහත් පිටුවහලක් වනු නොඅනුමානය.

*abeysinghedc@yahoo.com